# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 36 දරන

# අධිකරණ සංවිධාන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 ඔක්තෝබර් මස 04 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 ඔක්තෝබර් මස 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 20 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1983 අංක 36 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1983 ඔක්තෝබර් මස 04 වන දින.]

එල්. ඩී.—ඕ. 43/82

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1983 අංක 36 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1978 අංක 2 දරන පනතේ පස්වන උපලේඛනය සංශෝධනය කිරීම.

2. 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ පස්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) " ශ්‍රී ලංකාවේ සමාදාන විනිශ්චයකාරවරයෝ " යන ශීර්ෂය යටතේ දැක්වෙන අවසාන විෂයයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් විෂයයන් ඇතුළත් කිරීමෙන් :—

" සෑම දිසා විනිශ්චයකාරවරයකු හා පවුල්
අධිකරණයේ විනිශ්චයකාරවරයෙක්
මහෙස්ත්‍රාත්වරයෝ
එක් එක් ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා
අධිකරණ සේවා කොමිෂන් සභාවේ සහකාර ලේකම්වරයෝ
අධිකරණ සේවා කොමිෂන් සභාවේ පරිපාලන නිලධරයා ";

(ආ) " ශ්‍රී ලංකාවේ කොටස් සඳහා සමාදාන විනිශ්චයකාරවරයෝ " යන ශීර්ෂය යටතේ දැක්වෙන—

| | |
|---|---|
| " දිසා අධිකරණ විනිශ්චයකාරවරයෝ<br>එක් එක් පවුල් අධිකරණයේ විනිශ්චයකාරවරයා<br>මහෙස්ත්‍රාත්වරයෝ<br>එක් එක් ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා<br>එක් එක් කම්කරු විනිශ්චයාධිකාරයේ සභාපතිවරයා | තම අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන්නේ යම් ප්‍රදේශ තුළ ද ඒ ප්‍රදේශ සඳහා " |

යන විෂයයන් වෙනුවට පහත දැක්වෙන විෂයය ආදේශ කිරීමෙන් :—

" කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරයන් විසින් ස්වකීය අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන්නේ යම් ප්‍රදේශ තුළ ද, ඒ ඒ ප්‍රදේශ සඳහා ඒ සභාපතිවරයෝ ; " තව ද

(ඇ) ඒ උපලේඛනය අගට පහත දැක්වෙන අලුත් විෂයය එකතු කිරීමෙන් :—

" ග්‍රාමෝදය මණ්ඩල සභාපතිවරයෝ තම තමන්ගේ ඒ ඒ ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාස සඳහා. ".

ඒ 72058—10,675 (83/09)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.